# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2392/44 – 2024 ජූලි මස 11 වැනි බ්‍රහස්පතින්දා – 2024.07.11**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/2021/20.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2022.12.13 දිනැති හා අංක 2310/18 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2022.11.14 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කැළණිය පට්ටිය, බියගම පාර, අංක 316/ඒ හි පදිංචි පී. සිසිර මයා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 05, කිරුළ පාර, අංක 200, හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති A83/2022 හා 2024.05.21 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 ජුනි මස 25 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

බේරුම්කරණ හා කාර්මික අධිකරණ අංශය - කොළඹ

පී. සිසිර,
අංක 316/ඒ, බියගම පාර,
පට්ටිය,
කැළණිය.

*පැමිණිලිකරු*

ආරාවුල් අංකය: IR/COM/04/2021/20
බේරුම්කරණ අංකය: A/83/2022

*එදිරිව*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200,
කිරුළ පාර,
කොළඹ 05.

*වගඋත්තරකරු*

**බේරුම්කරණ තීන්දු ප්‍රකාශය**

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර මැතිතුමා විසින් 1957 අංක 14 සහ 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37) දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම්කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කොට මා වෙත යොමුකර ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ ;

"පී. සිසිර මහතා සම්බන්ධයෙන් ගන්නා ලද විනය ක්‍රියාමාර්ගයේ දී ඔහුට ලබාදුන් විනය නියෝගය මත වැඩ තහනම් කර සිටි 2018.10.29 දින සිට 2019.03.04 දින දක්වා කාලයට වේතන අහිමි කිරීම තුළින් ඔහුට අසාධාරණයක් සිදු වී තිබේ ද, එසේ අසාධාරණයක් සිදුවී තිබේ නම් ඔහුට ලැබිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ''.

***පසුබිම***

පළමු පාර්ශ්වය විසින් සිය මූලික සාක්ෂිය දිවුරුම් ප්‍රකාශ මගින් ලබාදුන් අතර ඒ අනුව පළමු පාර්ශ්වයේ සාක්ෂිකරු වූ පී. සිසිර මහතා A1 සිට A15 දක්වා ලේඛන ලකුණු කරමින් සාක්ෂි ලබා දී ඇත. පළමු පාර්ශ්වය වෙනුවෙන් නීතිඥ ආචාර්ය කේ. බී. සමන් ප්‍රියලාල් මහතා පෙනී සිටින ලදී. වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙනුවෙන් X සිට X3

දක්වා ද R1 සිට R59 දක්වා ද ලේඛන ලකුණු කරමින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙනුවෙන් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ධාවන) පතිරණ හේරත්ලාගේ රෝහණ ටියුඩර් චන්ද්‍රසිරි මහතා, ආරක්ෂක පරීක්ෂක (ආවරණ) උපුල් මාධව අස්වැවැල්ල මහතා, සහකාර මානව සම්පත් කළමනාකාර (විනය), කාල සටහන් සැලසුම්කරු ඒ. කේ. ඩී. පී. තිලෝචන මහතා, විනය විභාග නිලධාරී ඕ. ජී. එන්. කේ. සී. පෙරේරා යන සාක්ෂිකරුවන් 05 දෙනෙකු සාක්ෂි ලබාදී ඇත. දෙපාර්ශ්වය විසින් ම ලිඛිත දේශන මගින් වැඩිදුරටත් කරුණු ඉදිරිපත් කර ඇත.

*පළමු පාර්ශ්වයේ නෛතික ස්ථාවරත්වය*

පළමු පාර්ශ්වය විසින් දිවුරුම් ප්‍රකාශ මගින් සාක්ෂි ලබාදෙමින් සහ ලිඛිත දේශන මගින් පහත ස්ථාවරයන් ප්‍රකාශ කොට ඇත.

මෙකී නඩුවට මූලික වන්නේ A8 ලකුණු කර ඇති මුල්ම විනය නියෝගය මගින් A5 ලෙස ලකුණු කර ඇති චෝදනා පත්‍රයේ සඳහන් සියලු චෝදනාවන්වලට පළමු පාර්ශ්වය වැරදිකරු වීම මත වේ. එකී චෝදනාවලට උපමාන වූ මූලික ක්‍රියාවන් 02 කි.

01. ඉහළ නිලධාරීන්ගේ අනුමැතියකින් තොරව කඩවත බස් ගාල පරීක්ෂාවට ලක් කිරීම.
02. එමගින් WPVK 9282 දරන යතුරු පැදිය අස්ථානගත කිරීම.

පළමු පාර්ශ්වයේ නෛතික ස්ථාවරත්වය වනුයේ පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කරු පී. සිසිර මහතා V වන ශ්‍රේණියේ විධායක නිලධාරියකු බවත්, ඔහුට ඉහළ නිලධාරීන්ගේ අනුමැතියකින් තොරව අදාළ පරීක්ෂාවන් කිරීමට රාජකාරිමය වශයෙන් බලතල ඇති බවත් මේ නඩුවේ සාක්ෂි මගින් හෙළි වන බවයි.

මෙම නඩුවේ හරස් ප්‍රශ්නවලට භාජනය වූ පතිරණ හේරත්ලාගේ රෝහණ ටියුඩර් චන්ද්‍රසිරි යන සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත්තේ 'නිසි සැරිය' කාර්යභාරය ඉල්ලුම්කරුට පවරා ඇති බව ඔහු පිළිගන්නා බවත්, විධායක නිලධාරියෙක් වශයෙන් ඔහුගේ රාජකාරිමය ස්වභාවය තුළ ඔහුට පවරන ලද කාර්යභාරය සීමා නොවන බවත්, තමන් ඉල්ලුම්කරුගේ ඉහළ නිලධාරියා වුවත් තමාගේ උපදෙස් නොමැතිව ඉල්ලුම්කරුට විධායක නිලධාරියෙක් වශයෙන් ක්‍රියාත්මක වීමට පුළුවන් බවත් ප්‍රකාශ කොට ඇති බවයි. තවද ඔහු උපදෙස් ලබානොදුන්නත් රාජකාරී පැවරීමක් සිදුකළේ නැතත් ඉල්ලුම්කරුට රාජකාරී කිරීමට බාධාවක් නැති බවත්, කඩවත බස්ගාල පරීක්ෂා කිරීම රාජකාරියෙන් බැහැරව සිදුකරන ලද ක්‍රියාවක් නොවන බවත්, ඉල්ලුම්කරු යතුරුපැදිය හිතාමතා අස්ථානගත කර නැති බවත්, යතුරුපැදිය නවතා තිබූ ස්ථානයෙන් එය අස්ථානගත වී ඇති බවත් ය. ඒ අනුව ඉල්ලුම්කරුට කඩවත බස්ගාල පරීක්ෂා කිරීමට ඉහළ නිලධාරියකුගේ අනුමැතියක් අවශ්‍ය නොවන බවත්, විධායක නිලධාරියකු වශයෙන් එකී රාජකාරී ඉටු කිරීමට ඔහුට බලතල ඇති බවත් පළමු පාර්ශ්වයේ නෛතික ස්ථාවරය වන බවත් ය.

යතුරුපැදිය අස්ථානගත කිරීමේ චෝදනාව සැලකීමට ගත් විට වගඋත්තරකාර පාර්ශ්වය විසින් ලකුණු කරන ලද R30 දරන ලේඛනය අනුව පළමු පාර්ශ්වය විසින් යතුරුපැදිය අස්ථානගත වීම සම්බන්ධව 2018.10.12 දින කිරිබත්ගොඩ පොලීසියට පැමිණිලි කර ඇති බවත්, මෙම සිදුවීම අපරාධයක් ද නැතහොත් පැමිණිලිකරුගේ නොසැලකිල්ල මත සිදුවූ සිදුවීමක් ද යන්න විමර්ෂණය සිදුකරගෙන යන බවත්, මෙතෙක් සාර්ථක තොරතුරක් අනාවරණය වී නොමැති බවත් සඳහන් කොට ඇත. තවද R31 ලේඛනය අනුව එකී යතුරුපැදිය 2018.10.30 දින නවලෝක වටරවුම අසලදී සොයාගත් බවත්, යතුරුපැදියේ සියලුම අංග උපාංග හරියාකාරව ඇති බවත්, මෙම යතුරුපැදිය අස්ථානගතවීමක් බවට විමර්ෂණවල දී අනාවරණය වී ඇති බවත්, තවදුරටත් අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට අදහස් නොකරන බවත් දක්වා ඇත. තව ද ඉල්ලුම්කාර පාර්ශ්වය විසින් ලකුණු කර ඇති A7 ලේඛනය අනුව යතුරුපැදිය අස්ථානගතවීම සම්බන්ධයෙන් වගඋත්තරකාර පාර්ශ්වය විසින් නාරාහේන්පිට පොලීසියට කරන ලද පැමිණිල්ල ඉල්ලා අස්කරගෙන ඇත.

ඒ අනුව පළමු පාර්ශ්වය ප්‍රකාශ කර සිටිනුයේ චෝදනා නැගීමට ප්‍රමුඛ වූ යතුරුපැදිය සම්බන්ධ කාරණය මත ඉල්ලුම්කරුට එරෙහිව චෝදනා නැගීම හෝ ඊට ඉල්ලුම්කරු වැරදිකරු කිරීම නිත්‍යානුකූල හෝ සාධාරණ නොවන බවයි.

තවද, ඉල්ලුම්කාර පළමු පාර්ශ්වය විසින් එකී විනය නියෝගයට එරෙහිව අභියාචනයක් සිදුකර ඇති බවත් එකී අභියාචනය මගින් විනය නියෝගය ඉවත්කර නව අභියාචනා නියෝගයක් නිකුත් කර ඇති බවත්, A9 ලෙස ලකුණු කර ඇති එකී අභියාචනා නියෝග මගින්,

1. විනය නියෝගයෙන් ලබාදුන් දඬුවම ඉවත්කරමින් සේවය තහනම්ව සිටි කාලය දඬුවමට යටත් කිරීම.
2. මෙවැනි විෂමාචාරවලට ලක්නොවී කටයුතු කරන ලෙස තරයේ අවවාද කිරීම එලෙසම ක්‍රියාත්මක කිරීම.

නිර්දේශ කර ඇති බවත්, එකී නියෝගය සේවායෝජක පාර්ශ්වයේ විනය ව්‍යවස්ථා මාලාවට අනුකූල නොවන බවත්, සමස්ත විනය පරීක්ෂණ ක්‍රියාවලියම විනය පරීක්ෂණ ක්‍රියාවලිය පැවැත්විය යුතු නෛතික කාලරාමුව තුළ සිදුකර නොමැති බවත්, වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂි ලබාදුන් අභියාචන මණ්ඩලයේ සාමාජික ඒ. කේ. පී. ඩී. තිලෝචන යන අය හරස් ප්‍රශ්නවලට භාජනය වෙමින් ප්‍රකාශ කරන ලද්දේ සියලු චෝදනා යතුරුපැදිය අස්ථානගත වීම පදනම් වූ බවත්, ඉල්ලුම්කරුගේ සේවය එකී චෝදනා මත චේතන රහිතව නතර කළ බවත්, තමන් ඇතුළු සාමාජිකයින් අභියාචනයේ දී ඉල්ලුම්කාර පාර්ශ්වයට නිරායාසයෙන් බස්රථ පරීක්ෂා කිරීමට බලය ඇති බව පිළිගනිමින් විනය නියෝගයෙන් ලබාදුන් පළමුවෙනි දඬුවම සම්පූර්ණයෙන් ඉවත් කර ඇති බවත්, දඬුවමට යටත් කිරීමට වරදක් නොමැති බව හෙතෙම පිළිගන්නා බවත් ප්‍රකාශ කර ඇති බවත්, ඒ අනුව අභියාචනා මණ්ඩලය විසින් පළමු පාර්ශ්වය සේවය තහනම්ව සිටි කාලය දඬුවමට යටත් කිරීම නීත්‍යානුකූල, සාධාරණ හා යුක්ති සහගත නොවන බවටත් සිය ස්ථාවරය දක්වා සිටී.

*වගඋත්තරකාර පාර්ශ්වයේ නෛතික ස්ථාවරත්වය*

වගඋත්තරකාර ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සාක්ෂිකරුවන් 05 දෙනෙකු මගින් සහ සිය ලිඛිත දේශන මගින් පහත ස්ථාවරයන් ප්‍රකාශයට පත්කර ඇත. ඉල්ලුම්කාර පී. සිසිර මහතා 2018 ඔක්තෝබර් මාසයේ වැඩ කරන ලද දින 22 සඳහා දිනපොත් සටහන් ලබාදී නොමැති බවත්, තම වංචනික අරමුණු යටපත් කිරීම සඳහා එලෙස ක්‍රියාකර ඇති බවත්, ඉහළ නිලධාරීන්ගේ නියෝගයක් නොමැතිව තමන්ට අදාළ නොවන රාජකාරියක කඩවත ඩිපෝවට රාත්‍රියේ 7.30ට පමණ යෑම සනාථ කිරීමට කිසිඳු පිළිගත හැකි සාක්ෂියක් නොමැති බවත්, යතුරුපැදිය අස්ථානගත වූ දින සිට දින 04කට පසුව එකී අස්ථානගත වීම සම්බන්ධයෙන් සභාපතිවරයාට දැනුම් දී තිබූ බවත්, ආසන්නතම නිලධාරියා දැනුවත් කර නොමැති බවත්, ඉල්ලුම්කරු විවෘත භාවයකින් තොරව යමක් සැඟවීමේ අරමුණින් ක්‍රියා කර ඇති බවත්, ඉල්ලුම්කරු රජයේ විධායක නිලධාරියෙකු ලෙස තම ප්‍රධානියාට සිදුවූ සිද්ධිය සම්බන්ධයෙන් දැනුවත් නොකර ක්‍රියාකිරීම බලවත් වරදක් මෙන් ම ඔහුගේ වංකභාවය පිළිබිඹු කෙරෙන ක්‍රියාවක් වන බවත්, විනය පරීක්ෂණයේ දී ඉල්ලුම්කරු වැරදිකරු බවට තීරණය වූ බවත්, විනය ව්‍යවස්ථා මාලාවේ 10 වගන්තියේ (viii) අනුව මාස 06ක් දක්වා තාවකාලිකව සේවය අත්හිටුවීම සිදු කළ හැකි බවත්, එම කාලය තුළ වැටුප් ගෙවීම සිදු නොකරන බවත්, අභියාචනා නියෝගයෙන් දඬුවම අඩුකර ඇති නමුත් එය සම්පූර්ණයෙන් ඉවත් කර නොමැති බවත්, අභියාචනය සාර්ථක වීමට නම් දඬුවම අවවාදයක් බවට ලිහිල් විය යුතු බවත්, ඒ අනුව X2 ලෙස ලකුණු කර ඇති චෝදනා පත්‍රයේ 01 සිට 04 දක්වා සියලු චෝදනා ඔහුට එරෙහිව ස්ථාපනය කර ඇති බවත්, ඒ අනුව 05 වන චෝදනාවට නිරායාසයෙන් වැරදිකරුවෙකු වන බවත්, ඉල්ලුම්කරුගේ බරපතල විෂමාචාරයක් නිසා මෙකී දඬුවම් ලබා දී ඇති බවත් දඬුවම සාධාරණ බවත් එයින් ඉල්ලුම්කරුට කිසිදු අසාධාරණයක් සිදුවී නොමැති බවත්, සිය නෛතික ස්ථාවරය ලෙස දක්වා ඇත.

*තීන්දුව*

මෙකී බේරුම්කරණයේ දී මා විසින් සලකා බැලිය යුතු ඉතා වැදගත් කරුණක් ලෙස A9 ලෙස ලකුණු කර 2019.10.16 දිනැති අභියාචනා නියෝගය දැක්විය හැකිය. එකී නියෝගය මගින්,

1. විනය නියෝගයෙන් ලබාදුන් දඬුවම ඉවත් කරමින් සේවය තහනම්ව සිටි කාලය දඬුවමට යටත් කිරීම.
2. මෙවැනි විෂමාචාරවලට ලක්නොවී කටයුතු කරන ලෙසට තරයේ අවවාද කිරීම එලෙසම ක්‍රියාත්මක කිරීම.

ලෙස දක්වා ඇත.

එකී දඬුවම පැනවීම සම්බන්ධයෙන් A15 ලෙස ලකුණු කර අභියාචනා මණ්ඩලයේ තීරණය දැක්වෙන තීන්දු ප්‍රකාශයේ සඳහන් පහත කරුණු කෙරෙහි අවධානය යොමු කරමි.

''මෙම තත්ත්වය මත අභියාචනාකරුට නිරායාසයෙන්ම රාත්‍රී බස්රථ පරීක්ෂාවට බලය පැවරී ඇති බව අභියාචනා මණ්ඩලයේ අදහස වේ.''

''මෙම යතුරුපැදිය අවභාවිතා කර ඇති බවක් හෝ අස්ථානගත වීමෙන් ශ්‍රී ලංගමට මූල්‍යමය අලාභයක් වූ බවට පිළිගත හැක විධිමත් තක්සේරුවක් ඉදිරිපත් කර නොමැත.''

''එම විනය නියෝගය ලබාදීමේ දී අභියාචනා මණ්ඩලය අනාවරණය කරගන්නා ලද උක්ත කරුණු කෙරෙහි අවධානය යොමු නොකර ඇති බවට පෙනී ගිය හෙයින් මේ වන විට අභියාචනාකරු එම දඬුවම අත්විඳ ඇති අතර ඒ පිළිබඳව ද අභියාචනා මණ්ඩලය අවධානය කරන ලද අතර එම සියලු කරුණු සලකා බලා විත්තිකරු අභියාචනාකරු වෙත ශ්‍රී ලංගම/මාසක/විනය/111/2019 (105-2018) විනය නියෝගය මගින් ලබා දී ඇති අංක 01 දඬුවම ඉවත් කරමින් සේවය තහනම්ව සිටි කාලය දඬුවමට යටත් කිරීමටත් අංක 02 දඬුවම පිළිගැනීමටත් අභියාචනා මණ්ඩලය තීරණය කරන ලදී.''

A15 ලේඛනයේ අනුව විනය නියෝගය මගින් ලබා දී ඇති අංක 01 දඬුවම ඉවත් කරන බව පැහැදිලිව දක්වා ඇත. එසේ දඬුවම ඉවත් කරමින් සේවය තහනම්ව සිටි කාලය දඬුවමට යටත් කිරීම ලෙස නව දඬුවමක් පනවා ඇත.

A13 ලෙස ලකුණු කර ඇති ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ විනය ව්‍යවස්ථා මාලාව මගින් සේවකයකුගේ විනය සම්බන්ධ පරීක්ෂණයක් පැවැත්විය යුතු ආකාරය ලිඛිතව පැහැදිලිව දක්වා ඇත. එකී විනය ව්‍යවස්ථා මාලාවේ 4.3 වගන්තිය අනුව ස්ථිර සේවකයකුගේ සේවය තහනම් කොට දින 14ක් ඇතුළත චෝදනා පත්‍රයක් ලබා දිය යුතු වුවත් චෝදනා පත්‍රය ලබා දී ඇත්තේ මාස 03කට පසු බවත්, විනය නියෝගය ලබා දෙන්නේ සේවය අත්හිටුවා මාස 03කට පසුව බවටද සාක්ෂි මගින් අනාවරණය විය. පළමු පාර්ශ්වයේ පැමිණිලිකරුට එරෙහිව පවත්වනු ලැබූ විනය පරීක්ෂණය ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ විනය ව්‍යවස්ථා මාලාව මගින් දක්වන ලද නෛතික කාල රාමුව තුළ නිසි පරිදි පවත්වා නැත. අභියාචනා මණ්ඩලය මගින් ලබා දී ඇති A9 සහ A15 ලේඛනවල දක්වා ඇති ''සේවය තහනම්ව සිටි කාලය දඬුවමට යටත් කිරීමට'' යනුවෙන් දඬුවමක් එකී විනය ව්‍යවස්ථා මාලාවේ දක්වා නොමැති අතර මෙවැනි පරීක්ෂණයක දී දඬුවම් නියම කිරීමේ දී විනය ව්‍යවස්ථාවේ ලිඛිත ප්‍රකාශිතව දක්වා ඇති දඬුවම්වලින් පරිබාහිර වූ දඬුවම් පැනවීමට එකී විනය මණ්ඩලයට හෝ අභියාචනා මණ්ඩලයට නෛතික ප්‍රතිපාදනයක් නොමැත.

තවද, වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂි ලබාදුන් වගඋත්තරකාර ආයතනයේ කාලසටහන් සැලසුම්කරු ලෙස කටයුතු කරනු ලබන සහ මෙහි ඉල්ලුම්කාර පළමු පාර්ශ්වයට ලබා දී තිබූ විනය තීන්දුවට එරෙහිව සිදුකළ අභියාචනයේ දී එකී අභියාචන මණ්ඩලයේ සාමාජිකයන් තිදෙනාගෙන් එක් අයෙක් වූ ඒ. කේ. පී. ඩී. තිලෝචන මහතාගේ හරස් ප්‍රශ්නවලට භාජනය වෙමින් ලබාදුන් පහත සාක්ෂි පිළිබඳව අවධානය යොමු කරමි.

''ප්‍ර. අභියාචනා මණ්ඩලය යතුරුපැදිය අවභාවිතා කළ බවට හෝ මූල්‍ය හානියක් වූ බවට වාර්තාවක් නැහැ කියලා මහත්තයා කියනවා ?

පි. ඔව්

ප්‍ර. ඉල්ලුම්කරුගේ චෝදනා පත්‍රයට පදනම් වුනේ රාජකාරි නොකිරීමයි. යතුරුපැදිය අස්ථානගත වීමයි කියලා නේද?

පි. කරුණු කිහිපයක් තියෙනවා

ප්‍ර. ඒ මත පදනම් වෙලානේ ?

පි. ඔව්

ප්‍ර. අභියාචනා මණ්ඩලය එම මූලික කරුණු 2 ප්‍රතික්ෂේප කළා ?

පි. ඔව්. බැහැර කරලා තියෙනවා''

''ප්‍ර. මහත්තයා දන්නවානේ සංශෝධනයයි ඉවත් කිරීම කියන එකෙයි වෙනස දන්නවනේ. ඔය සංශෝධනයක් ද කරලා තියෙන්නේ ඉවත් කිරීමක් ද කරලා තියෙන්නේ ?

පි. ඉවත් කිරීමක්.

ප්‍ර. මහත්තයා පැහැදිලිව විනය නියෝගයෙන් ලබාදුන් පළවෙනි දඬුවම මුළුමනින්ම ඉවත් කරලා තියෙනවා ?

පි. මුළුමනින්ම ඉවත් කරලා තියෙනවා

ප්‍ර. ඒ ඉවත් කළ දඬුවමට තමයි අලුත් දඬුවමක් පමුණවලා තියෙන්නේ. අභියාචන මණ්ඩලය එහෙමනේ වුනේ ?

පි. ඔව්

ප්‍ර. අලුත් දඬුවම සේවය තහනම්ව සිටි කාලය දඬුවමට යටත් කිරීම ?

පි. හරි

ප්‍ර. මහත්තයාට නැවත වරක් යෝජනා කරනවා දඬුවමට යටත් කිරීමට වරදක් තිබිය යුතුයි නේද ?

පි. ඔව්

ප්‍ර. අභියාචන මණ්ඩලයේ මම මහත්තයට යෝජනා කරන්නේ දඬුවමට යටත් කරන්න වරදක් නැහැ කියලා ?

පි. වරදක් නැහැ කියලා පිළිගන්නවා''

මෙම සාක්ෂිකරු මෙම බේරුම්කරණ පරීක්ෂණයේ ඉල්ලුම්කරුගේ අභියාචනය විභාග කරන ලද අභියාචන මණ්ඩලයේ සාමාජිකයෙකු බැවින් එකී සාක්ෂිය අන් හැම සාක්ෂියකටම වඩා ප්‍රබලවේ. මෙහි දී ඉල්ලුම්කාර පළමු පාර්ශ්වයට ලබාදුන් විනය නියෝගයේ පළමු දඬුවම ඉවත් කළ බවත්, ඉල්ලුම්කරු වරදක් කර නොමැති බවත් සාක්ෂිකරු විසින් ප්‍රකාශිතවම පිළිගනී. එම ස්ථාවරය අනුව චෝදනා පත්‍රයේ සඳහන් වරද නමැති ක්‍රියාව ස්ථාපිත වී නොමැති බැවින් එකී චෝදනාවලින් ඉල්ලුම්කරු නිදොස් බවට තීරණය කරමි. චෝදනාවලට නිවැරදිකරු වූ අයෙකුට එරෙහිව එම චෝදනා යටතේ දඬුවමක් ලබා දීම නීත්‍යානුකූල නොවන අතර එකී අභියාචනා නියෝගය ව්‍යවස්ථාපිත නීතියට පටහැනි වේ.

ඒ අනුව දෙපාර්ශ්වය විසින්ම ඉදිරිපත් කරනු ලැබූ සාක්ෂි, ගොනු කරන ලද ලිඛිත දේශන මගින් ඉදිරිපත් කර ඇති සියලු කරුණු සලකා බැලීමෙන් අනතුරුව පහත තීරණයට එළඹියෙමි.

ඉල්ලුම්කාර පළමු පාර්ශ්වයට එරෙහිව වගඋත්තරකාර ආයතනය මගින් ලබා දී ඇති A9 ලෙස ලකුණු කර ඇති අභියාචනා නියෝගය සාධාරණ හා යුක්ති සහගත නොවන බැවින් සම්පූර්ණයෙන්ම බල රහිත කරමි. ඒ අනුව ඉල්ලුම්කාර පළමු පාර්ශ්වය වැඩතහනමට ලක්ව සිටි 2018.10.29 දින සිට 2019.03.04 දින දක්වා කාලයට චේතන අහිමි කිරීම සාධාරණ හා යුක්ති සහගත නොවන බැවින් ඔහුට සිදුව ඇති අසාධාරණය වෙනුවෙන් එකී කාල සීමාවට ලැබිය යුතු වැටුප් සහ වෙනත් ව්‍යවස්ථාපිත දීමනා පහත පරිදි ගෙවිය යුතු බවට නියෝග කරමි.

| | |
|---|---|
| ඉල්ලුම්කරුගේ මාසික මූලික වැටුප | : රු. 39,462.00 |
| ඉල්ලුම්කරුගේ සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය (8%) | : රු. 3,156.96 |
| ඉල්ලුම්කරුගේ මාසික දළ වැටුප | : රු. 36,305.04 |
| වැඩතහනම්ව සිටි මාස 04 කාලයට ගෙවිය යුතු දළ වැටුප (රු. 36,305.04 × 04) | : රු. 145,220.16 |
| සේවකයා විසින් ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය (08%) (රු. 3,156.96 × 04) | : රු. 12,627.84 |
| ආයතනය මගින් මාස 04 කාලය සඳහා ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය (12%) (රු. 4,735.44 × 04) | : රු. 18,941.76 |
| ආයතනය මගින් මාස 04 කාලය සඳහා ගෙවිය යුතු ආයතනය මගින් සේවක භාරකාර අරමුදල් දායකත්වය (3%) (රු. 1,183.86 × 04) | : රු. 4,735.44 |

සම්පූර්ණ ගෙවිය යුතු හිඟ මුදල වන රුපියල් එක්ලක්ෂ හතලිස් පන්දහස් දෙසීය විස්සයි ශත දාසයක (රු. 145,220.16) ක මුදල පැමිණිලිකාර පළමු පාර්ශ්වය වෙනුවෙන් මෙම නියෝගය *ගැසට් පත්‍රයේ* පළ වී දින 30ක් ඇතුළත සහකාර කම්කරු කොමසාරිස් නැගෙනහිර කොළඹ කම්කරු කාර්යාලය වෙත තැන්පත් කරන ලෙසත් සියලු ව්‍යවස්ථාපිත දීමනා නිසි පරිදි ගෙවන ලෙසත් දෙවන පාර්ශ්වයේ වගඋත්තරකාර ආයතනය වන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට මෙයින් නියෝග කරමි.

මෙය සාධාරණ හා යුක්ති සහගත තීරණයක් බවට තීරණය කරමි.

නීතිඥ පියල් දර්ශන ගුරුගේ,
බේරුම්කරු.

2024 මැයි මස 21 වැනි දින.

EOG 07 - 0102

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.